**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

# සියලු අවදානම් රක්ෂණ ඔප්පුව

**ඔප්පු වර්ගය:** සියලු අවදානම් රක්ෂණය

**ලබා දෙනු ලබන මූලික ආවරණය:**

රක්ෂණ ඔප්පුවේ විශේෂයෙන් බැහැර කර ඇති ඒවා හැර හදිසි අනතුරක් හෝ අහඹු සිදුවීමක්/අනතුරක් නිසා, අලුත්වැඩියාවක් හෝ ප්‍රතිස්ථාපනයක් අවශ්‍ය වන ආකාරයෙන් රක්ෂිත දේපල හෝ එහි ඕනෑම කොටසක් අහිමි වීම හෝ හානි වීම ආවරණය කරයි.

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

**අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණයන් ලබා ගත හැකිය):**

1. වැඩවර්ජන කැරලි කෝලාහල සහ මහජන කැළඹීම් (SRCC) - *කරුණාකර පිටසන බලන්න - "SRCC පිටසන - SR 06"*

2. ත්‍රස්තවාදය - *කරුණාකර පිටසන බලන්න - "ත්‍රස්තවාදය පිළිබඳ පිටසන - TR 16"*

**ප්‍රධාන ලක්ෂණය(යන්):**

**විධිවිධාන:**

- මෙම ඔප්පුව යටතේ ඕනෑම එක් රක්ෂිත කාලසීමාවක් තුලදී සමාගමෙහි වගකීම පහත සඳහන් ප්‍රමාණය නොඉක්මවයි:
  - අ) රක්ෂිත දේපලෙහි ඕනෑම එක් අයිතමයක් සම්බන්ධයෙන් එයට ඉදිරියේ දක්වා ඇති රක්ෂිත මුදල.
  - ආ) යුගලයක හෝ කට්ටලයක කොටසක් වන ඕනෑම භාණ්ඩයකට සිදුවන අලාභය හෝ හානි සම්බන්ධයෙන්, යුගලයක් හෝ කට්ටලයක් වශයෙන් තිබීමේදී එම කොටසට හෝ කොටස්වලට තිබිය හැකි විශේෂ වටිනාකමක් පිළිබඳව නොසලකා අලාභ විය හැකි හෝ හානි විය හැකි විශේෂිත කොටසෙහි හෝ කොටස්වල වටිනාකම, නමුත් ඕනෑම අවස්ථාවක යුගලය හෝ කට්ටලය සම්බන්ධයෙන් රක්ෂිත මුදලේ සමානුපාතික කොටසක් නොඉක්මවිය යුතුය.
  - ඇ) සියලුම අලාභ හෝ හානි සම්බන්ධයෙන් මුළු රක්ෂිත මුදල.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, - "සීමාවන්" කොටස බලන්න*

**ආවරණය නොවන දේ (ව්‍යතිරේක):**

1. යුද්ධය.
2. වැඩවර්ජන, කැරලි කෝලාහල, මහජන කැලඹීම් සහ ත්‍රස්තවාදය (අමතර ආවරණ වශයෙන් ලබාගෙන නොමැති නම්).
3. භූමිකම්පාව, ගිනිකඳු පිපිරීම හෝ ස්වභාව ධර්මයේ වෙනත් කම්පනයන්.
4. සුළි කුණාටුව, හරිකේන් සුළි කුණාටුව, ටොනාඩෝ සුළි කුණාටුව, සුළි සුළං, කුණාටු හෝ වෙනත් වායුගෝලීය කැළඹීම්.
5. අගුළු නොදැමූ වාහනයක කිසිවෙක් නොමැති අවස්ථාවකදී සොරකම් කිරීම නිසා ඇතිවන අලාභය හෝ හානිය.

6. කෘමීන්, පණුවන්, භාවිතය නිසා ගෙවී යාම, දිලීර, කුණුවීම, ක්‍රමයෙන් පිරිහීම සහ රක්ෂිතයාගේ රැකවරණයේ හෝ භාරයේ සිටින ගෘහාශ්‍රිත සතුන්.
7. යාන්ත්‍රික දෝෂ හෝ විදුලිය ඇණහිටීමක් හෝ අක්‍රමිකතාවයක්
8. පිරිසිදු කිරීම, ඩයි කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ ඕනෑම ක්‍රියාවලියක්.
9. ආලෝකයේ ක්‍රියාකාරිත්වය, වායුගෝලීය හෝ දේශගුණික තත්ත්වයන් හෝ බාහිර උෂ්ණත්වය.
10. ගින්නක් හෝ සොරසතුරු ක්‍රියාවක් නිසා සිදුවී තිබුණහොත් මිස, වීදුරු හෝ බිඳෙන සුළු ස්වභාවයේ වෙනත් ද්‍රව්‍ය කැඩී බිඳී යාම හෝ සීරීමට ලක් වීම.
11. කාච සීරීම
12. මුදල්, සුරැකුම්පත්, ඔප්පු, බැඳුම්කර, විනිමය බිල්පත්, පොරොන්දු පත්‍ර, තොග හෝ කොටස් සහතික, කාසි, අත්පිටපත්, මුද්දර, ලේඛන හෝ ගමන් ටිකට්පත්, ස්පර්ශ කාච, ක්ෂුද්‍ර කෝනියල් කාච, වාහන, ජල යාත්‍රා, ගුවන් යානා හෝ ඒවායෙහි ඕනෑම එකක උපාංග හෝ පශු සම්පත්.
13. රේගු හෝ වෙනත් නිලධාරීන් හෝ බලධාරීන් විසින් රඳවා තබා ගැනීම, රාජසන්තක කිරීම, විනාශ කිරීම හෝ අත්පත් කර ගැනීම හෝ නීතියේ ඕනෑම ක්‍රියාවලියක් යටතේ අත්පත් කර ගැනීම හෝ විකිණීම හෝ රක්ෂිතයාට දේපල අත්හැරීම.
14. සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන ස්ථානයෙන් ඉවත් කර ඇති අවස්ථාවකදී ඕනෑම කොටසක් අලාභවීම හෝ හානියට පත්වීම, හෝ වීදුරු කැඩීබිඳී තිබුණහොත් මිස, ආලෝක නල වලට හානි සිදුවීම.
15. ආවේණික දෝෂයක් හෝ දෝෂ සහිත වැඩ, දෝෂ සහිත ද්‍රව්‍ය හෝ නිර්මාණය.
16. ගින්නෙන් හෝ සොරකමකින් හැර වෙනත් ආකාරයකින් වාර්තා, චිත්‍රපටි හෝ ටේප් පට නැතිවීම හෝ හානි වීම (භාවිතයට නොගත් ද්‍රව්‍ය ලෙස සැලකූ අවස්ථාවන්හිදී වටිනාකම පමණි)
17. රක්ෂිතයා යටතේ සේවයේ නියුතු ඕනෑම පුද්ගලයකු විසින් සිදු කරන ලද සොරකම හෝ වංකකම හේතුවෙන් ඇතිවන ඕනෑම පාඩුවක් හෝ හානියක්.
18. වැරදීමක් හෝ අතපසුවීමක් හේතුවෙන් ඇතිවන ඕනෑම හිඟ තත්ත්වයක්.
19. පරිගණක මෘදුකාංගයට සිදුවන අලාභය හෝ හානිය.
20. ඕනෑම ආකාරයක අනුශංගික අලාභයක්.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02, - "ව්‍යතිරේකයන්" කොටස බලන්න*

**<u>වාරික ගෙවීමේ ක්‍රමය:</u>**

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

**<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:</u>**

1. අලාභය/හානිය පිළිබඳව ඔබ දැනගත් වහාම 011-2206306 යන අංකය ඔස්සේ අප අමතන්න.
2. නීතියෙන් නියම කර ඇති පරිදි (සොරකමක්, ද්වේෂසහගත හානියක්, කැරළි කෝලාහල සහ වැඩවර්ජන, ගිනි තැබීම් හෝ සැකසහිත ගිනි තැබීමකදී වැනි) සිද්ධිය පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කරන්න.
3. තෙවන පාර්ශවයක් විසින් කිසියම් හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, කිසිම පොරොන්දුවක් ඔවුනට ලබා නොදී එය අප වෙත යොමු කරන්න.
4. මෝටර් රථවාහන නොවන හිමිකම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන හිමිකම් පෝරමය

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

පුරවා ඔබගේ හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා ඉල්ලා සිටින අනෙකුත් ලියකියවිලි සමග එය හැකි ඉක්මණින් ආපසු එවන්න.

5. දේපල පිළිබඳ හිමිකම් පෑමක් නම්, හානිවූ දේපල නිරීක්ෂණය කිරීම සඳහා තක්සේරුකරුවෙක් හෝ විමර්ශන නිලධාරියෙක් හැකි ඉක්මණින් යවනු ලැබේ.

6. අලාභය/හානිය තක්සේරු කිරීම අලාභයේ ස්වභාවය අනුව සුදුසු අලාභ තක්සේරුකරුවෙක් විසින් සිදු කරනු ලැබේ.

7. අවශ්‍ය ලියකියවිලි:

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
- අදාළ වන්නේ නම්, පොලීසියට කරන ලද පැමිණිල්ලෙහි පිටපතක්
- ඇස්තමේන්තු සහ බිල්පත්
- හිමිකම් පෑම සැකසීමේදී රක්ෂණ සමාගමට අවශ්‍ය විය හැකි වෙනත් ඕනෑම ලියවිල්ලක්

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" කොටස යටතේ කරුණු අංක 03 සහ 04 බලන්න*

**<u>වංචාව:</u>**

රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ චේතනාන්විතව තොරතුරු වසන් කර ඇත්නම්, හෝ එයට සාධක වශයෙන් ව්‍යාජ ප්‍රකාශ කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම් පෑමක් භාරගනු නොලැබේ.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" කොටස යටතේ කරුණු අංක 07 බලන්න*

**<u>ඔප්පු හිමියාගේ වගකීම:</u>**

වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම්

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.
- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම්

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.
- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.
- අලාභය හෝ හානිය වැළැක්වීම සඳහා රක්ෂිතයා සියලු සාධාරණ පූර්වාරක්ෂක පියවර ගත යුතුය.
- හිමිකම් පෑමකදී නිවැරදි වන්දි මුදල ලබා ගැනීම සඳහා, රක්ෂිතයා දේපළ එහි වර්තමාන වෙළඳපල වටිනාකමට රක්ෂණය කර ඇති බවට සහතික විය යුතුය.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, "කොන්දේසි" කොටස යටතේ කරුණු අංක 11 බලන්න*

**PEOPLE'S INSURANCE**
EMPOWERING A RESILIENT NATION

**<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

**<u>ආරවුල් විසඳීම:</u>**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිලිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක: 1, බෙතෙස්ඩා පෙදෙස,
කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:- අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05, ''ආරවුල් විසඳීම'' යන කොටස බලන්න*

**<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>**

**රක්ෂණය අවලංගු කිරීම:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, ''කොන්දේසි'' යන කොටස යටතේ කරුණු අංක 09 බලන්න*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිලිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

**වැදගත් සටහන්:**

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ ඉංග්‍රීසි මුද්‍රණයේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**වැඩිදුර තොරතුරු සඳහා:**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:
- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්